- **ප්‍රවේශ පත්‍ර ලැබුණු වහාම අයදුම්කරුවන් වෙත ලබාදිය යුතුය.**
- **අයදුම්පත්‍ර වහාම අපේක්ෂකයින් වෙත ලබා නොදීමෙන් සිදුවන ගැටළු සම්බන්ධයෙන් විදුහල්පති වගකිව යුතුය.**
- **මෙහි සඳහන් උපදෙස් පිළිබඳව ද ඔවුන් දැනුම්වත් කිරීම අනිවාර්ය වේ.**

**DP/GIT/2026/06**

මගේ අංකය : 6/10/GIT/2026
පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.
2026.10.  දින

සියලු ම පෞද්ගලික පාසල් විදුහල්පතිවරුන් වෙත,

## සාමාන්‍ය තොරතුරු තාක්ෂණ (GIT) විභාගය - 2026

මෙවර සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය 2026 ඔක්තෝම්බර් මස 24 වන සෙනසුරාදා දින පෙ.ව.9.00 සිට ප.ව.12.10 දක්වා පැවැත්වේ.

02. මෙම විභාගය ලිඛිත පරීක්ෂණයක් ලෙස පැවැත්වීමට තීරණය කර ඇති අතර, එම විෂයය නිර්දේශයේ වෙනසක් සිදුකර නොමැති බව ද දැනුම් දෙමි. තවද එම විභාගය පෙර පැවති ආකාරයෙන්ම I පත්‍රය (බහුවරණ) හා II පත්‍රය (පිළිතුරු ලිවීම) ලෙස කොටස් දෙකකින් සමන්විත බවද දන්වමි.

03. මෙම විභාගයට ඔබ විසින් ඉදිරිපත් කරන ලද අයදුම්කරුවන්ට නියමිත පැමිණීමේ ලේඛනය සහ ප්‍රවේශ පත්‍ර මේ සමඟ ඔබ වෙත එවා ඇත. විභාග අයදුම්කරුවන්ගේ නම්වල **අක්ෂර වින්‍යාසය, ජාතික හැඳුනුම්පත් අංකය, විභාගයට පෙනී සිටින මාධ්‍ය** ආදිය ඔබගේ කාර්යාලයේ තිබෙන අයදුම්පතේ පාසල් පිටපත සමඟ ඉතා සුපරීක්ෂාකාරීව සසඳා බැලිය යුතුය.

- ප්‍රවේශ පත්‍රවල අයදුම්කරුගේ නම, මාධ්‍ය හෝ ස්ත්‍රී/පුරුෂ භාවයෙහි වෙනසක් ඇත්නම් මාර්ගගතව https://onlineexams.gov.lk වෙබ් අඩවිය වෙත පිවිස Private Schools මත Click කර පරිශීලක නාමය (School Code) හා මුරපදය (Password) යොදා පාසල් ගිණුම මත ප්‍රවේශ වී සංශෝධන සිදු කර ගත යුතුය.
- එක් අයදුම්කරුවකුට **සංශෝධන** සිදු කිරීමට අවස්ථාව ලැබෙනුයේ **එක් වරක් පමණි.** එබැවින් අවශ්‍ය සංශෝධනය නිවැරදිව තහවුරු කරගෙන එක වරම මාර්ගගතව සිදු කළ යුතු ය.
- කිසිදු හේතුවක් මත විභාග මධ්‍යස්ථාන මාරු කිරීම් සිදු කරනු නොලැබේ.
- මාර්ගගතව සිදු කරන සියලු ම සංශෝධන සඳහා අදාළ ලේඛන වෙන වෙනම බාගත කර මුද්‍රණය කර ප්‍රවේශ පත්‍රය සමඟ අමුණා එම අයදුම්කරුවන් වෙත ලබා දෙන්න.
- සංශෝධන සිදු කිරීම 2026.10.21 වන දින ප.ව. 4.00ට අවසන් කරනු ලැබේ. අවශ්‍ය තාක්ෂණික උපදෙස් ද උක්ත සබැඳිය මගින්ම බාගත කර ගත හැකි වේ.

04. ඇතැම් විදුහල්පතිවරුන් ඉහත ආකාරයට මාර්ගගතව සංශෝධනයන් සිදු නොකර ශාලාධිපතිවරුන්ට පමණක් එම සංශෝධන ගැන දැනුම් දෙන බව පෙනේ. එසේ විදුහල්පතිගේ දැනුම්දීම මත එම සංශෝධනයන් සිදු කිරීමට ශාලාධිපතිවරුන් වෙත උපදෙස් ලබාදී නොමැත. එසේම අයදුම්කරුවන් විසින් මොනයම් සංශෝධනයක් සඳහා හෝ පෞද්ගලිකව කරන ඉල්ලීම් පිළිබඳව විභාග දෙපාර්තමේන්තුව කටයුතු නොකරන බව අයදුම්කරුවන් වෙත දැනුම් දිය යුතුය. සියලුම සංශෝධන ඔබ මගින්ම කළ යුතුය.

05. පාසල් හැරයාම හෝ වෙනත් හේතුවක් මත හෝ ප්‍රවේශපත්‍ර ලබා ගැනීමට නොපැමිණි අයදුම්කරුවන්ගේ ප්‍රවේශපත්‍ර මා වෙත නොඑවා පසුව මෙවැනි අයදුම්කරුවන් පැමිණ ප්‍රවේශ පත්‍ර ඉල්ලා සිටිය හොත් එම ප්‍රවේශපත්‍ර නිකුත් කරන්න. අයදුම්කරුවකුට අදාළ ප්‍රවේශ පත්‍රය හැර වෙනත් කෙනෙකුගේ ප්‍රවේශ පත්‍රයක් භාර නොදීමට අවශ්‍ය පියවර ගැනීම ඔබගේ වගකීම වේ. ප්‍රවේශ පත්‍රය භාරදෙන අවස්ථාවේ පැමිණීමේ ලේඛනයේ ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයේ එම අයදුම්කරුවන් ලවා අත්සන් කරවා ගත යුතුය.

Scanned with CamScanner

06. ඔබගේ පාසලේ සියලුම අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම ඔබ විසින් හෝ ඔබ විසින් බලය පවරන ලද නියෝජ්‍ය/සහකාර විදුහල්පතිවරයෙකු විසින්ම කළ යුතුය.

07. එක සමාන නම් ඇති අයදුම්කරුවන් ඔබ විදුහලේ සිටී නම් ඔවුන් වෙත ප්‍රවේශ පත් බෙදා දීමට පෙර එම අයදුම්කරුවන්ගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය පරීක්ෂා කිරීමෙන් පසුව ප්‍රවේශ පත්‍ර නියමිත අයදුම්කරුවන් වෙත නොපමාව භාරදිය යුතුය.

08. ඉල්ලීම් කර ඇති මාධ්‍යයෙන් පමණක් පිළිතුරු ලිවිය යුතු බවත්, විභාග ශාලාවේදී මාධ්‍ය මාරු කළ නොහැකි බවටත් අපේක්ෂයින් දැනුම්වත් කළ යුතුය.

09. සෑම අයදුම්කරුවකුම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අන්දමින් තමන්ගේ අනන්‍යතාව ඔප්පු කිරීමට පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ ඉදිරිපත් කළ යුතු ය.

**විභාග අපේක්ෂකයන් බ්ලූටූත් (Bluetooth) වැනි විද්‍යුත් සන්නිවේදන උපකරණ/උපාංග (Electronic communication Devices) භාවිත නොකරන බව සහතික කර ගැනීම සඳහා විභාග ශාලාවේදී විභාගය පැවැත්වෙන කාලසීමාව තුළ තම කන්දෙක විවෘතව පැහැදිලිව පෙනෙන සේ තබා ගත යුතුය. එම විභාග නීති උල්ලංඝනය කරනු ලබන අපේක්ෂකයින් සඳහා නීත්‍යානුකූලව කටයුතු කරනු ලබන බව විභාග අපේක්ෂකයන් දැනුවත් කළ යුතුය.**

10. විභාග මධ්‍යස්ථානයේ දී වංචනික ක්‍රියා සිදු කරන අපේක්ෂකයන්ට 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත අනුව දඬුවම් පැමිණ වීමට කටයුතු කරන බැවින් විභාග වංචාවලින් වලකින ලෙසට අපේක්ෂකයන්ට තරයේ උපදෙස් ලබා දිය යුතුය.

11. ප්‍රතිඵල නිකුත් කිරීමේ දී වෙබ් අඩවිය මගින් බාගත කර ගැනීම සඳහා තම තමන්ගේ විභාග අංක, විභාගය පැවැත්වූ වර්ෂය හා විභාග මධ්‍යස්ථානය ආදිය සටහන් කරන ලද ප්‍රවේශ පත්‍රයේ තීරුවක් වෙන් කර ඇත. එම කොටස ප්‍රවේශ පත්‍රයෙන් වෙන්කොට සුරක්ෂිතව තබා ගන්නා ලෙස අයදුම්කරුවන්ට උපදෙස් ලබා දෙන්න.

12. විභාග ගැටලු සම්බන්ධයෙන් පහත දුරකථන අංක හා විද්‍යුත් තැපැල් ලිපිනයෙන් ඔබට අවශ්‍ය තොරතුරු ලබාගත හැකිය.

**පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව**

| | |
|---|---|
| දුරකථන අංක :- | 011-2784208, 011-2784537, 011-2785413, 011-2786616 |
| ෆැක්ස් අංකය :- | 011-2784411 |
| විද්‍යුත් ලිපිනය :- | gitexams24@gmail.com |

**මාර්ගගත ඒකකය**

දුරකථන අංකය:- 0113661122

මෙම කාර්යය සාර්ථක කර ගැනීමට ඔබ දක්වන සහයෝගය අතිශය අගය කරමි.

ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස් ජනරාල්

D:\Nimali\GIT EXAM\Principal Instruction 2026.docx

Scanned with CamScanner